# සිංහල නාට්‍යය

## ඒ. ජේ. ගුණවර්ධන

ජාතික නාට්‍ය සංස්ථාව මේ මැයි මස අරඹන ලද සිය වැඩසටහන ක්‍රියාත්මක කළ ද සිට සැම සෙනසුරාදා දිනකම එමගින් පෙන්වනු ලබන නාට්‍යයන් නැරඹීමට එකොළොස් දහසක් පමණ ජනයා පැමිණි බව වාර්තා විය. ප්‍රවේශපත්‍ර එකොළොස්දහසක් විකිණී තිබුණැයි කීම වඩාත් උචිත යයි පැවසෙනුයේ සැම දවසකම එකම ප්‍රේක්ෂක සමූහයක් මෙයට පැමිණෙන හෙයිනි. එහෙත් සංඛ්‍යාවන් ගැන නිෂ්ඵල තර්ක ඉදිරිපත් කිරීමට මහන්සි විය නොහේ. කිනම් අංශයකින් අපි ඒ ගැන සලකා බැලුවද මේ නම් කාගේ වුවද සැලකිල්ලට භාජන විය යුතු සංඛ්‍යාවකි. සාමාජික තත්වය, අධ්‍යාපනික සුදුසුකම් යනාදිය කුමක් හෝ වේවා හැම තරාතිරමකම, හැම තත්වයකම වාගේ ජනයා තුළ ඇති නාට්‍ය පිළිබඳ උනන්දුව මෙයින් නිනැතින්ම පෙනී යන කරුණක් හෙයිනි.

වෙනත් අතකින් සලකනකල, මෙය ඇත්තවශයෙන්ම අප කාගේත් විශ්මයට හේතුවන දෙයකි. නාට්‍යයට ඇල්මක් ඇති කාටත් මෙය ඉමහත් සතුටක් ගෙනදෙන කරුණක් වනුවාට සැක නැත. එහෙත් මේ අවස්ථාවේ සතුටු විය යුත්තේ නාට්‍යයට බැඳී සිටින, නාට්‍යයට හිතකාමී අය පමණක් නොවේ. ජාතික උන්නතිය ප්‍රාර්ථනා කරන කාගේත් අවධානය මෙයට යොමු විය යුතුය. එය දියුණු කටයුතු දෙයක් හැටියට සැලකිය යුතුය. ඒ නාට්‍යය ප්‍රධාන වශයෙන් ගත්කල විනෝදය සඳහා යොමුවුවක් වන අතරම ජාතියකගේ අපේක්ෂාවන්, බලාපොරොත්තු, ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ජාතියකගේ ගැටළු පිරික්සා බැලීමේ මගක් වන හෙයිනි—නැතහොත් එසේ විය යුතු හෙයිනි.

ජාතියක් හැටියට අපේ එදිනෙදා ජීවිතයෙහි හැබී පෙනෙනා එක් විශේෂ ලක්ෂණයක් නම් විනෝදය ගත කිරීමට, විනෝද වීමට, ඇති පහසුකම් ඉතා විරල බවයි. මෙහි ප්‍රතිඵලය අපි මෙහි විස්තර නොකළත් කාට වුවද වැටහෙන පැහැදිලිව පෙනෙන දෙයකි. පොදු විනෝදය සඳහා ඇති පහසුකම්වලද, සුළු මුදලකට ලබාගතහැකි ඒද, ඒ අතර ප්‍රධාන තැනක් ගන්නා සිනිමාව පහත් රසයක් ගෙනදෙයි. එය හැකිම අප්‍රසන්නයි. ඒ වගේම එය හානිකරය. දැනට අපට ලැබෙනා පමණ විනෝදය සපයනා දේ හැටියට ගනන් ගත හැක්කේ සිංහල නාට්‍යය පමණි. සිංහල නාට්‍යය යනුවෙන් මම මෙහි හඳුන්වන්නේ ජාතික නාට්‍ය සංස්ථාව මගින් ඉදිරිපත් කෙරෙනා ඒවායි. පොදු ජනයාට විනෝදය ගෙනදෙන නොයෙකුත් දේ මගින් ඇතිකරවන පහත් රුචිකත්වය මගහැරවීමට ඇති එකම දෙයත් මේ නාට්‍යයන්ය.

මෙහිදී මම බලාපොරොත්තුවන්නේ ජාතික ජීවිතයෙහි නාට්‍යය ගන්නා වැදගත් තැන ගැන සාකච්ඡා කිරීම නොවේ. නාට්‍යයෙහි වැදගත් කම ගැන මතභේදයන් ඇතිවිය නොහැකි බව මගේ විශ්වාසයයි. සිංහල නාට්‍යය අද පවත්නා තත්වයත් එය ගමන් ගන්නා නව මගත් අනාගතයේදී එය දියුණුවට ඇති කරුණු ගැනත්, සොයා බැලීම මගේ අදහසයි.

මේ කාර්යය සඳහා අපි මෑත අතීතය දෙස එබී බැලිය යුතුයි. සිංහල නාට්‍ය ඉතිහාසය සලකා බැලීමේදී 1956 වෙනි වර්ෂය වැදගත් වන්නේය. මේ අවුරුද්ද මෙතරම් වැදගත් වන්නේ ඇයි? සිංහල නාට්‍යයේ නව යුගයක් උදාකළ ''**මනමේ**'' නාටකය බිහිවූයේ මේ වසරේදී බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ. හතර අවුරුද්දක් ඇවෑමෙන් වුවද එහි ආලෝකය බිඳකුදු නොඅඩුව පවතී. මීට පෙරත් වැදගත් යයි සැලකිය හැකි නාට්‍යයන් නොතිබුනා නොවේ. මෙයට උදාහරණයක් වශයෙන් **කපුවා කපෝති, රහස් කොමසාරිස්** යන ඒවා ගත හැකිය. මේ හැමෙකක්ම පාහේ ප්‍රහසනයන්ගේ ගණයට වැටේ. මේවායේ පරමාර්ථය වූයේ සමාජයේ දුර්වල කම් උපහාසයට ලක් කිරීමය.

සාමාන්‍යයෙන් මේවා වඩාත්ම ප්‍රියවූයේ උගත් මැදපන්තික ජනයාටය. බටහිර දිග නාට්‍යයන් අනුව යමින් ලාංකික සමාජයට ගැලපෙන අයුරු සකස්කර ගත් මේ නාට්‍යයන්ගේ මාර්ගයෙන් සිංහල නාට්‍යය තාත්විකත්වයට මුල් තැන දිණි. මෙකල පැවතුණු, දෙශනා-ස්වරූපයෙන් යුත් දෙබස්වලින් ගහණ, සමහර උපදෙශාත්මක නාට්‍යයන්ගෙන්, සිංහල නාට්‍ය කලාව බේරාගැනීමට මේවාට හැකි විය. සමස්තවශයෙන් ගත්කල, මේ ප්‍රහසනයන්ගේ ආභාසය සීමිත එකක් විය. ඒ ගණයෙහිලා සැලකිය හැකි, උවමනාතරම් වෙනත් නාට්‍යයන්, ඊට පසු රචනා නොකෙරිණි. අනුවාදය කොට සකස් කරගත හැකි, නාට්‍යයන්ගේ ගණනද සීමිතය. අදත් මේ ප්‍රහසනයන් ජනප්‍රිය ය. එහෙත් ඒවා නරඹන ප්‍රෙක්ෂකයන් එකම පංතිය-කට අයත් අයය. එකල මෙන්ම මෙකලත්, ඒ ප්‍රෙක්ෂක සංඛ්‍යාව සීමා සහිතය.

වෙන වචනවලින් කියනවා නම්, ''**වෙදහටන**'' මෙන්ම මේවාටත් පොදු ජනයා අතර මුල්බැසගැනීමට නොහැකි විය. ජනප්‍රිය නාට්‍ය ක්‍රමයකට පදනම් කොට ගත හැකි තත්වයක් මේ නාට්‍යවල නොතිබුණි. එහෙත් සුප්‍රසිද්ධ විදේශීය නිෂ්පාදකයෙකු අතින් හැඩවුණු **වෙද හටන** මෙන්ම, මේ නාට්‍යයනුත්, සිංහල නාට්‍යය කෙරෙහි කාගේත් අවධානය යොමුකරවීමට තරම් සමත්විය. පහත් ලෙස සලකනු ලැබූ සිංහල නාට්‍යය, ඉන් ගොඩගැණීමට, මේවා උදව්විය. සිංහල නාට්‍යයට යම්කිසි වැදගත්කමක් ආරොපනය කිරීමට තරම් මේවා කාගේත් සැලකිල්ලට භාජනවිය.

සිංහල නාට්‍යය මෙතරම් උසස් අවස්ථාවක වැජඹෙන මෙවැනි වකවානුවක නම්, මෙය මෙතරම් වැදගම්මකට අයත් දෙයක් හැටියට නොපෙනෙන්ට පුළුවන. එහෙත් ඉංග්‍රීසිය ආධිපත්‍යය පැතිරවූ අවධියෙහි මෙය යම්කිසි වැදගත් කමක් ඉසිලිය. සිංහල නාට්‍යය කෙරෙහි උනන්දුවක් දක්වන, එයට ඇල්මක් ඇති, ප්‍රෙක්ෂක සමූහයක් සිටින බව, ප්‍රකට කරවීමට තරම්, මේ නාට්‍යයන් සමත් විය. මෙපමණක් නොව මේවා ප්‍රතිභා ශක්තිය ඇති නිෂ්පාදකයින්ට අභියෝගයක ස්වරූපයක් දැක්විය යනු මගේ විශ්වාසයයි.

මේ නාට්‍යයන් බුද්ධිමතුන්ට විෂයවූ බව මෙහි සඳහන් කළ යුතුය. එකල ලංකාවේ, හැම ප්‍රදේශයකම පාහේ රඟදැක්වූ සංචාරක නාට්‍ය කණ්ඩායම් දෙකතුනක් මගින් ඉදිරිපත් කරනු ලැබූ භාවාතිශය නාට්‍ය සම්ප්‍රදයෙන් සම්පූර්ණයෙන්ම වෙනස්වුණු නාට්‍යයන්ය, **කපුවා කපෝති** ආදිය, මේ භාවාතිශය නාට්‍යයන් මගින් ප්‍රධාන වශයෙන් අදහස්කරණු ලැබූයේ, ශෝකය සහ හාස්‍යය ගැබ්වුණු, සිංදු නැටුම් ආදී හැම අංගයක්ම සංකලනයෙන් ඇතිවුණු සංකර නාට්‍යයක් ඉදිරිපත්කොට ප්‍රෙක්ෂකයන් ගෙවූ මුදලට සෑහෙන පමණ විනෝදය සැපයීමය — එහෙත් මේ භාවාතිශය නාට්‍යයන් දැන් දැන් නැවතත් කලඑළි බසින නමුත්, ඒවා ගැන සැලකිල්ල යොමුකිරීම මෙතැනදී අදහස් නොකෙරේ.

එතරම් දියුණු නොවුවද, බටහිර නාට්‍යයන්හි, තාත්විකත්වය පිළිබඳ අදහස්වලට අනුව නාට්‍යයන් රඟදක්වනු ලැබූ අවදියකය 'මනමේ' නාටකය ඉදිරිපත් කරනු ලැබුයේ. මේ නාට්‍යය මහජනයා අතර එතරම් පිළිගැණිනි. එය ඉතාමත් සාර්ථක තැනක් විය. **මනමේ** නාට්‍යය ගත් පියවරෙහි ප්‍රතිඵල දැනුදු දක්නා ලැබේ. '**මනමේ**' නාට්‍යය සම්ප්‍රදය අනුව යමින්, එහෙත් කාලානුරූපව කලාත්මකව සකස් කෙරුණකි. එහි සාර්ථකත්වය නාට්‍යයෙහි ඉදිරි ගමන නිශ්චය කළේය. එමනිසා ඊටපසු ඇතිවූ සිංහල නාට්‍යය, ශෛලිගත සම්ප්‍රදය මත ගොඩ-නැගුණාක් මෙන්ම, බෞද්ධ කථාශ්‍රයෙන් ගෙතුණු එවාද විය.

එමනිසා, මෙකල සිංහල නාට්‍යයෙහි කැපී පෙනෙන විශේෂ ලක්ෂණයක් නම්, එය ශෛලි-ගත සම්ප්‍රදයානුකූලව සකස් වීමයි. මේ ලක්ෂණය **කපුවා කපෝති, රහස් කොමසාරිස්** වැනි නාට්‍යයන් ගත් මගින් සම්පූර්ණයෙන් බැහැරවුවද සිංහල නාට්‍ය ප්‍රෙක්ෂකයාට නුහුරු දෙයක්ම නොවූ බව නොකිවමනාය. ශෛලිගත නාට්‍ය සිංහල වේදිකාවට එහෙමපිටින්ම අළුත් ඒවාද නොවේ. එනෙකුදු මේ නාට්‍ය සම්ප්‍රදය ඉතා ඉක්මණින් ජනප්‍රිය වීම නිසාත් එයට සෑම තරාතිරමක ජනයාගේම සිත් ඇදීගොස් තිබෙන නිසාත්ය ඊට හේතුවන කරුණු අප විසින් විමසිය යුතුමය.

**මනමේ** නාටකය ගැන මෙතෙක් බොහෝ දේ ලියැවී තිබෙන හෙයින් එය විග්‍රහකිරීම අනවශ්‍යය. මෙහිදී මගේ තර්කයට අදාළ වන්නේ එහි සන්දර්භය නොව එය නිර්මාණය සඳහා ඉවහල් වී ඇති කොටස්ය. මම අදහස් කරන්නේ ඒ නාට්‍යය සමස්ත වශයෙන් සළකා

සහ **මැටිකරත්තය** ගැන නාට්‍යයන් හැරුණුකොට අනිත් හැම එකක්ම සාමන් සංකීර්ණ නොවූ, එලෙසම ජනයා අතර පැතිර පැවැති කථාය.

මේවාය පසුගිය අවුරුදු කීපය තුළ සිංහල නාට්‍යයෙහි ප්‍රාණ නාලිය වී ඇත්තේ. එලෙසම අනාගතයෙහි ද මහජනයා ඇදී එනුයේ මේ නාට්‍යයන් බැලීමටය.

මේ සියලුම නාට්‍යයන්හි පෙනෙන — මේවාට පොදු වූ යම්කිසි වැදගත් ලක්ෂණ ඇත. මේ සැම කථාවක්ම අනිත සිද්ධියක්ය. එසේත් නැත්නම් මේවා ප්‍රේක්ෂකයා, යටගියාව සමග සම්බන්ධ කරන ලද්දක්ය. මේ කථා වර්තමානයට කෙලින්ම නැකම් නොදක්වයි. මේවායේ ඇතුළත් වන්නේ සරල කථාය. මේ නාට්‍යයන් ඇස හා කණ පිනවන අතර බුද්ධිවිෂයක් නොවන්නේය. මේ නාට්‍යවල නිතැතින්ම ඇති අඩුපාඩුකම් මේවාය. නිෂ්පාදකයන්ගේ නාට්‍ය රචකයන්ගේත් ඇසින් බලන කල ශෛලිගත සම්ප්‍රදයේ ඇති තවත් අඩුපාඩුවක් නම් අසංකීර්ණ කථාවලට පමණක්ම මෙහි ඉඩ කඩ සැලසී තිබීමයි. ඒවා ඉදිරිපත් කරන විලාසය නිසා සියුම් චරිත නිරූපනය ආදියක් ඇතිකළ නොහැක. පාත්‍රවර්ගයාට දියහැකි දෙබස් සීමිතය.

මුලින් සඳහන් කෙරුණු නාට්‍යයන් පහත්කොට සැළකීමක්වත් මේවායින් සිංහල නාට්‍යයට සිදුවුණු සේවය සුළුකොට තැකීමක් වත් මින් අදහස් නොකෙරේ. සිංහල නාට්‍යය සම්පතම් නැගී සිටීමට තැන්කරන මේ අවධියේ මෙවැනි විවෙචන ඉදිරිපත් කිරීම පවා අනුවණ කමකි. ඇත්ත වශයෙන්ම ලෝකයේ වෙනත් රටවල මේ ගණයෙහි ගැණෙන අතිකූත් නාට්‍යයන් හා සසඳන කල, **මනමේ** සහ **එලොව ගිහින් මෙලොව ආවා** යන නාට්‍යයන් ඒවා හා සමතැන් ගන්නවා නොඅනුමානය.

අපි ඒවායේ යථා තත්ත්වය ගැන අවබෝධයක් ඇතිව එහි අඩුපාඩු කම් ගැන සැළකිලිමත් විය යුතුය. මේ නාට්‍ය සමහරක්, අපට තෘප්තිමත් විය හැකි තරමින් විනෝදයක් ලබා දෙයි. එනෙකුදු වුවත්, බුද්ධිගෝචර වන නාට්‍යයන් නිපදවීමේ කාලය පැමිණ තිබේයැයි මගේ විශ්වාසයයි. අපට අද අවශ්‍ය වන්නේ, අපේ බුද්ධිය පුබුදු කරවන විරාගත අදහස් උදහස් පරීක්ෂණයට භාජන කරන මානුෂික සබඳකම් සිතුම් පැතුම් හා ගැටළු විග්‍රහ කරන ලෙස, විචාරාත්මක ඇසින් බලන නාට්‍යයන්ය. අපට උවමනා කන් පිනවන ගී රාවයක් මතකයෙහි රඳවන නාට්‍යයන් පමණක් නොව, අපේ කල්පනා ශක්තියද පුබුදු කරවන ඒවාය.

මෙයින් මා අදහස් කරන්නේ මින්පසු නාට්‍ය ක්‍රම පිළිබඳ අත්හද බැලීම් එහෙම පිටින්ම අත්හිටවා **බර්නාඩ් ෂෝ** ගේ වැනි විවාදත්මක නාට්‍යයන් ලිවීම හා නිෂ්පාදනය ඇරඹීම නොවේ. ඊට හාත්පසින්, වර්තමානයේ කරගෙන යනු ලබන අත්හද බැලීම් එලෙසම තව දුරටත් කරගෙන යා යුතුයි. එනෙකුදු, නිෂ්පාදකයා හෝ නාට්‍ය රචකයා කථාවක් කීමෙන් පමණක් සෑහීමට පත් නොවිය යුතුය. සම්ප්‍රදයාත්මක ආකෘතිය තුළ වර්තමාන කථාවක් ගැබ් කිරීමට වෑයම් කළ යුතුය. මිනිස් සිතෙහි ගැඹුරට කිමිදිය යුතුය. මිනිස් ස්වභාවය හාරා අවුස්සා බැලිය යුතුය. එහෙත් **මනමේ** නාට්‍යයෙන් වපුරන ලද බීජයන් විනාශවීමට ඉඩ නොතැබිය යුතුය.

නාට්‍ය ක්‍රම තිබෙනුයේ එකක් පමණක්ම නොවේ. එමෙන්ම නාට්‍ය දියුණුවට ද එක මාර්ගයක්ම අදළ නොවේ. මේ කරුණු ගැන රචකයාගේත්, නිෂ්පාදකයාගේත් අවධානය යොමු විය යුතුය. ජීවිතයෙන් ඈත් වූ නාට්‍යයන්ගෙන් රටක ජනයාට නාට්‍යයෙන් නියම ඵලය ලබා ගැනීමට නොහැකි බව අප සිහියට ගත යුතුය.

සාමාන්‍යයෙන් සළකන කල බුද්ධියට විෂය වන නාට්‍ය, රස විඳීමට තරම් මුහුකුරාගිය රුචිකත්වයක් ඇති ප්‍රේක්ෂක පිරිසක් තවම බිහි වී නැති බවට සමහරුන් තර්ක කිරීමට පුළුවන. මෙය සත්‍යයක් වුවද නිෂ්පාදකයින් හා රචකයින් නාට්‍යයෙහි එක් විශේෂ වැදගත් අංශයක් නොසළකා හැරීමට එය ප්‍රමාණවත් කරුණක් නොවේ. මගේ අදහසේ හැටියට නම්, මෙසේ නාට්‍යය අමුතු මඟක ගමන් කරවීමට තැනක් දරන ලද්දේ එක්වරෙක පමණි. ඒ **පුෂ්පරාගය** නාට්‍යයෙනි. එයට ඇදී ආ යුතු තරම් ජනයා මෙසේ නොඒම මෙවැනි නාට්‍යයන් ඉදිරිපත් කිරීමට නිෂ්පාදකයින් අධෛර්යමත් විය යුතු කරුණක් නොවේ.

ගැඹුරු අදහස් තාත්වික සම්ප්‍රදයානුකූල නාට්‍යයන් මගින් පමණක් ඉදිරිපත් කළ හැකියැයි නොසිතිය යුතුය. අනික් අතින් සළකන කල ගැඹුරු චින්තනයට යොමුකරවනවාත් සමගම වර්තමාන ප්‍රේක්ෂකයාගේ රුචිකත්වයට සරිලන නාට්‍යයක් නිපදවිය හැකි බව මගේ හැඟීමයි. මේ අදහස අරමුණු කරගෙන නව අත්හද බැලීම් කළ යුතු බව මගේ විශ්වාසයයි.